# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,685 — 1966 මාර්තු 4 වැනි සිකුරාද — 1966.3.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 185 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | 187 | අය–වැය ලේඛන .. .. .. | 192 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 190 | දේපළ විකිණීම් .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | 190 | මාර්ග කොමිටි දැන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — | විවිධ දැන්වීම් .. .. .. | 192 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.—බී. 4/51.

### ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නිසි බලධරයා විසින් එනම්, යාපනේ දිස්ත්‍රික්කයේ පුලෝපලයි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දීය.

#### නියෝග

1. කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) ඒ සතා සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේ නම් මිස, හෝ

(ආ) මේ නියෝගයේ (අ) ඡේදය යටතේ ඒ සතා අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 24 කාල සීමාවක් ඉකුත් වී යාමෙන් පසුව යම් අවස්ථාවකදී, හෝ

(ඇ) කිසියම් දිනක පූ. භා. 9 ටත් 12 ටත් අතර කාලයේ දී මිස, ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

---

**නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින අඟලකට රු. 10ක් සහ වැඩිවන සෑම අඟලක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් අය කරනු ලබන ගාස්තුව වෙනුවට, 1966 මාර්තු මස 1 වෙනි දින සිට, වෙළඳ ලකුණු දැන්වීම් හැර, අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින්ම අය කරනු ලබන බව සැමදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.**

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1966 පෙබරවාරි මස 11 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

එහෙත් විශේෂ යයි තමා අදහස් කරන සවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

2. 1 වැනි නියෝගය යටතේ අනුමත කළාට පසු ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇති යම් සතකු නැවතත් පරීක්‍ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි ඒ නියෝගය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස, ඒ සතා ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. (1) යම් සතකු 1 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියොත් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

(2) මේ නියෝගය යටතේ මැරීම තහනම් කරනු ලැබූ කිසිම සතෙකු කිසිම තැනැත්තකු විසින් නොමැරිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතකු ගෙන එන සැම තැනැත්තකු විසින් ම ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමි භාග යෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍යවූ සෑම විධිවිධානයක්ම යොදා ගත යුතුය.

5. ගෝ ඝාතක ස්ථානයට යම් තසකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්‍ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමිභාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

6. ගෝ ඝාතක ස්ථානයේදී මරන ලද යම් සතකුගේ කුණපය හෝ අතුනු බහන් ආදිය සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ කල්පනාවේ හැටි යට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් ඔහු විසින් ඒ කුණපය හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ කුණපය හෝ අතුණු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම වළකින අන්දමින් ඉවත් කරවීම කළ යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ නියමය යටතේ මිස කිසිවකු විසින් එකී කුණපය හෝ අතුනු බහන් ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 3 වෙනි නියෝගය යටතේ මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු ගෝ ඝාතක ස්ථානයකදී මැරීමට එහි භාර කරු විසින් අවසර නොදිය යුතුය.

8. මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් "වී.සී.පී." යන අකුරු හා අවස්ථෝචිත පරිදි "දේශීය හරක් මස්", "එළු මස්" හෝ "ඌරු මස්" යන සලකුණු වලින් එකක් හෝ මුද්‍රා තබා තිබේ නම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ කුණපය ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නො කළ යුතුය.

9. වෙන යම් සතකු ඉදිරියේ හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත් කර හෝ මුවාකර ස්ථානය ශුද්ධ පවිත්‍ර කරනතුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. යම්කිසි බෝවෙන රෝගයකින් ස්පර්ශයෙන් බෝවෙන රෝගය කින් හෝ සමේ රෝගයකින් ළඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් පෙළෙමින් සිටි තැනැත්තකුට සාත්තු කිරීමෙහි යෙදී සිටි කිසිවකුට එකී රෝගය බෝවෙන කාලසීමාව හෝ විසබීජ මෝරන කාල සීමාව ඉකුත් වන තුරු යම්කිසි ගෝ ඝාතක ස්ථානයකට ඇතුල්වීමට හෝ මස් පිණිස සතුන් මැරීමේ කටයුතුවල යෙදීමට ගෝ ඝාතක ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් අවසර නොදිය යුතුය.

11. සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් සුදුසු සියළුම අවස්ථාවලදී ගෝ ඝාතක ස්ථානයට ඇතුල්ව එහි ස්ථානය පරීක්‍ෂා කර බලනු ලැබීම නිත්‍යානුකූල වනවාත් හැර, එම ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් ඔහුට ඒ සඳහා අවශ්‍ය සියලුම සහාය දිය යුතුය.

12. සභාව විසින් පිහිටුවා ඇති ගෝ ඝාතන ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතු අතර ගාස්තු ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් නිත්‍යානු කූල කුවිතාන්සියක් නැතිව කිසිම සතකු නොමැරිය යුතුය.

| | රු. ශ. |
|---|---|
| හරකුන් සඳහා එකකුට ... | ... 1 00 |
| එළුවන් හෝ බැටළුවන් සඳහා එකකුට | ... 0 50 |

13. සෑම ගෝ ඝාතක ස්ථානයකම භාරකරු විසින් ගෝ ඝාතක ස්ථානයේ මරනු ලබන එක් එක් සතා පිළිබඳ විස්තර ලේඛනයක් සභාව විසින් නියම කළ හැකි ආකෘතිය අනුව තබාගත යුතුය.

14. මේ නියෝගවලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වෙත පවරා ඇති බලතල, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ සාමාන්‍ය හෝ විශේෂ නියම යන් යටතේ ක්‍රියා කරන ඕනෑම නිලධරයකු විසින් ක්‍රියාවෙහි යෙද විය හැකිය.

15. මේ නියෝගවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් යාපනේ දිස්ත්‍රික්කයේ පුලෝපලයි ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ.

3–5—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 65/46

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ යාපනේ දිස්ත්‍රික්කයේ කරෙයිතිවු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදි තව එකී වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ටී. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966. 1. 29 දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථා

### අප්‍රසන්නවූ සහ අන්තරාදායකවූ ව්‍යාපාර

1958 පෙබරවාරි 28 වැනි දින අංක 11,268 දරන ගැසට් පත්‍රයේ පළවූ අප්‍රසන්න සහ අන්තරාදායකවූ ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 1 වැනි ඡේදයෙහි (ඒ) කරුණට ඉක්බිතිවම පහත සඳහන් කරුණ, එනම්:—"(ඔ) මාලු අයිස් දැමීම" යන්න යෙදී මෙන් ඒ අතුරු ව්‍යවස්ථා තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3–7—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පණතින් සංශෝධිත (257 වැනි අධිකාරිය) ගම්සභා ආඥපනතේ 13 (1) වැනි වගන්ති යෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නැගෙනහිර පළාතේ පහළ කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, බර්ට්රම් අර්නෝල්ඩ් ජයරාජා කාසිනාදර් වන මම, අම්පාර දිස්ත්‍රික්කයේ උඩ පළාත ගම්සභාවෙහි අංක 2 දරණ කොට්ඨාසයේ සභික අබ්ගලගේ හරමානිස් සිංඤෝ මහතා, සභාවට දැනුම් දීමෙන් තොරව, පිළි වෙළින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තේරී ගැනීමෙන් අනතුරුව නොපැමිණීම ගැන සෑහීමකට පත් වී, එකී අම්පාර දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්සභාවේ අංක 2 දරන කොට්ඨාසයේ සභික අබ්ගලගේ හරමානිස් සිංඤෝ විසින්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට සවකීය සභික ධුරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
නැගෙනහිර (පහළ) කොට්ඨාශයේ
පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966 පෙබරවාරි මස 17 දින,
මඩකලපුවේ දී ය.

3–167—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## කෑගල්ල නගර සභා ප්‍රදේශයේ ඡන්දදායක කොට්ඨාශ නැවත බෙදා වෙන් කිරීම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව

කෑගල්ල නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතරම් දුරට සමාන වන සේ දැනට එහි පවත්නා ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීම් වස් පහත සඳහන් කරුණු පිළිබඳව අවශ්‍ය පරීක්ෂණ පවත්වා වාර්තා කර සිටීම පිණිස පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අධිනීතිඥ ඈන්. කුමාර සිංහම් මහතා පත් කර තිබේ.

(අ) දැනට කෑගල්ල නගර සභා සීමාවෙන් පිටත පිහිටා ඇත්තාවූ ප්‍රදේශ සුදුසු නම් නගර සභා පාලනයට ඇතුළත් කිරීම.

(ආ) යෝජිත කෑගල්ල නගර සභා ප්‍රදේශයේ ප්‍රමාණය, ජනගහණය හා වෙනත් සාධක අනුව සිටිය යුතු සභික සංඛ්‍යාව කොපමණ දැයි නිගමණය කිරීම.

(ඇ) කෑගල්ල නගර සභාවේ සීමාවන් විස්තර කිරීම.

(ඈ) නැවත බෙදා වෙන් කරනු ලබන කෑගල්ල නගර සභාවේ එක් එක් කොට්ඨාශයේ සීමාවන් විස්තර කිරීම යන මේවාය.

මෙම කාර්‍යභාරයන්ට අදාළ වූ ඕනෑම කරුණක් සම්බන්ධව ඕනෑම සංවිධානයකට හෝ මහජනයාට ඔවුන්ගේ ලිඛිත නියෝජන සින් 1966 මාර්තු 14 වැනි දිනට පෙර ඉදිරිපත් කරණ ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. මෙසේ ප්‍රකාශ කරණු ලබන සියලුම නියෝජන යන් පිටපත් තුනකින් යුතුවද, හැකි නම් ටයිප් මුද්‍රිතවද ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

මෙම කොමිෂන් සභාව විසින් කෑගල්ලේදී ප්‍රසිද්ධ සභා වාරයක් පවත්වනු ලැබේ. දිනයන් හා ස්ථානය යථා කාලයේදී දැනුම් දෙමි.

ඇල්. ජී. සිරිවර්ධන (ප. පා. ස. කො.),
ලේකම්,
පරීක්ෂණ කොමිෂන් සභාව.

පළාත් පාලන කාර්‍යාලය,
රත්නපුරය,
1966.3.2.

3–213—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න.)

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය කින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමර්ථ්‍යයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ආ) කාර්යක්ෂමතා කඩඉම්.—පත්වීම් ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත් වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් " නව ප්‍රවේශක නිලධාරි " යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත හටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවක් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.**

**8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.**

**(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයාගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම්ව සිටින්ද නැත්දයි සඳහන් කළ යුතුය.**

**(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.**

**(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා** අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

**(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යෙන් පසු කරනු ලැබීමටත් ඉඩ තිබේ.**

**(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත්** නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.**

**(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.**

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

**සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.**

**(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට** අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ /හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර. දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

**I වන ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පි තනතුර—නාගරික ක්ෂුද්‍රජීව විද්‍යාඥගේ රසායනාගාරය—කොළඹ නගර සභාව**

ඉහත සඳහන් තනතුර සඳහා පිරිමි හා ස්ත්‍රී පක්ෂයේ නිලධාරීන්ගෙන් පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **තනතුරට නියමිත වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 2,940—8×120—4×180—4,620.

තෝරාගනු ලබන අයදුම්කරු සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වැටුප් පෙත්තක තබනු ලබනු ඇත.

3. තනතුර ස්ථිරයි; විශ්‍රාම වැටුප් සහිතයි. ස්ත්‍රී පක්ෂයේ නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් පළමුව අර්ථසාධක අරමුදලක් පදනම්කරගෙන පත්වීමක් දෙනු ලැබේ. එසේ පත්කරනු ලබන නිලධාරිනිය අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම අර්ථසාධක අරමුදලේ සාමාජිකාවක් ලෙස තවදුරටත් සිටීමට හෝ 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමයට පරිවර්තනය වීම යන මින් දෙකින් එකක් තෝරාගැනීම සඳහා මනාපය පළ කළ යුතුව ඇත. මෙම තෝරා ගැනීම වෙනස් කළ නොහැකි වන්නේ ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අවස්ථා දෙකකට නොවැඩි ගණනකදී රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එකක් සහිතව, විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ රසායනික විද්‍යාව සහ පහත සඳහන් විෂයයන් ගෙන් එකක් සමග ඊට උසස් විභාගයකින් හෝ සමත් වී සිටිය යුතුයි. (භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව සහ ජීව විද්‍යාව) අයදුම්කරුවන් මනා පුහුණුවක් ලැබ සිටිය යුතු අතර, රසායනාගාරයක සියලුම වැඩ පිළිබඳ පළපුරුද්දක් ද ලබා සිටිය යුතුය. ඔවුන්ට පිළිගත් වෛද්‍ය පර්යේෂණාගාරයක හෝ බොහෝ කල් සිට පැවතෙන රෝග විනිශ්චය පිළිබඳ වූ රසායනාගාරයක හෝ අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය. තවද, ක්ෂුද්‍රජීව විද්‍යාව සහ "කියුට මීඩියා" (සකස් කිරීම පිළිබඳ මනා දැනුමක් ඔවුන්ට තිබිය යුතුය. රෝග පරීක්ෂණාගාරයක කරනු ලබන රෝග විනිශ්චය පිළිබඳ දැනුමක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් සහතික වල පිටපත් (මුල් සහතික නොව) අයදුම් කරුවන් විසින් අයදුම් පත්වලට ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය. (බෞතීස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

6. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් ආකෘති පත්‍රයෙහි පිළියෙළ කොට 1966.3.22 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 8, 11, 13 වැනි ශීර්ෂයන් වෙනුවට පහත සඳහන් කොට ඇති කරුණු යොදා ගතයුතුයි :—

"8. අධ්‍යාපනික සුදුසුකම් සහ අවසානවරට සමත්වූ විභාගය. දිනයන් සහිතව, සමත් විෂයයන් සඳහන් කළ යුතුයි.

11. (ඊ) වෛද්‍ය පර්යේෂණාගාරයක හෝ රෝග විනිශ්චය පිළිබඳවූ රසායනාගාරයක හෝ සේවය කර ඇත්නම්, දරණ ලද තනතුරු, කාල සීමාවල් යනාදිය පිළිබඳ විස්තර සඳහන් කරන්න.

13. (අ) විශේෂ පුහුණුවක් ලබා ඇත්නම්, ඒ පිළිබඳ විස්තර සුදුසුකම් පළපුරුද්ද (විස්තර සැපයිය යුතුයි.)

(ආ) ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව මනා දැනුමක් ඇද්ද යන වග සහ "කියුට මීඩියා" සකස් කිරීම සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර."

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව, රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිතුමා වෙත හෝ ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු දක්වමින්, ඒ අයදුම් පත්‍ර භාරගන්නා ලෙස ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබුව හොත් මිස, සලකා බලනු නොලැබේ.

10. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් භාර ගත් බැව් දක්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 පෙබරවාරි මස 24 දින,
කොළඹ,
තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

2–156—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන ලිපිකරු, සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියේ ලිපිකරු පන්තියට උසස් කිරීමේ විභාගය, 1965.9.4

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියේ සිට II වැනි ශ්‍රේණියේ විධායක ලිපිකරු පන්තියට උසස් කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

'ඒ' ප්‍රදේශය

| නම | | ලිපිනය |
|---|---|---|
| 1. ඩැනියල්ස්, සී. එම්. | ... | කොළඹ නාගරික සභාව. |
| 2. දයාරත්න, පී. ඩී. | ... | මතුගම සුළු නගර සභාව. |
| 3. ප්‍රනාන්දු, කේ. ඕ. | ... | මීගමුව නාගරික සභාව. |
| 4. ගුණතිලක, එම්. ඩී. ජේ. | ... | පිළියන්දල සුළු නගර සභාව. |
| 5. ජයවර්ධන, එල්. ඒ. ජී. | ... | දෙවිනුවර සුළු නගර සභාව. |
| 6. ලියනගේ, ඩී. පී. | ... | මිනුවන්ගොඩ සුළු නගර සභාව. |
| 7. නානායක්කාර, ජී. අයි. | ... | කොළඹ නාගරික සභාව. |
| 8. නාරන්ගොඩ, ඩබ්ලිව්. එල්. | ... | කොළඹ නාගරික සභාව. |
| 9. ඔබේසේකර, යූ. එම්. එල්. එච්. ද එස්. | | කොළඹ නාගරික සභාව. |
| 10. සෙන්දනායක, ඩී. ආර්. | ... | කොළඹ නාගරික සභාව. |
| 11. සිරිවර්ධන, ටී. ඩී. අයි. | ... | හොරණ පළාත් ආණ්ඩු සභාව. |
| 12. සෝමන්දර, පී. | ... | අහංගම සුළු නගර සභාව. |
| 13. වීරසූරිය, ජේ. ඒ ඒ. | ... | කොළඹ නාගරික සභාව. |
| 14. විජේතුංග, ඒ. ඩී. පී. | ... | හෝමාගම සුළු නගර සභාව. |
| 15. විජිතසේන, එම්. එස්. | ... | කොළඹ නාගරික සභාව. |
| 16. විමලසේන, එම්. බී. | ... | ගාල්ල නාගරික සභාව. |
| 17. විමලසුන්දර, එච්. ජී. | ... | මාතර පළාත් ආණ්ඩු සභාව. |

'බී' ප්‍රදේශය

| නම | | ලිපිනය |
|---|---|---|
| 18. බණ්ඩාර, ජේ. එම්. එස්. | ... | රක්වාන සුළු නගර සභාව. |
| 19. ධනසේකර, ටී. බී. | ... | වැලිමඩ සුළු නගර සභාව. |
| 20. ගොඩමුන්න, ආර්. එල්. බී. | ... | මහනුවර නාගරික සභාව. |
| 21. මහිල්, ඒ. එච්. එම්. | ... | ගම්පොල පළාත් ආණ්ඩු සභාව. |
| 22. පෝද්දල්ගොඩ, ඩබ්. එම්. ආර්. ඩී. බී. | | මහනුවර නාගරික සභාව. |
| 23. වනිගදේව, ඊ. | ... | අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය. |
| 24. වික්‍රම, ඩී. ජේ. | ... | කුරුණෑගල නාගරික සභාව. |
| 25. වීරසේකර, ඩබ්. එම්. ඩී. බී. | | හැටන්-දික්ඔය පළාත් ආණ්ඩු සභාව. |
| 26. වික්‍රමසිංහ, ඒ. එම්. | ... | මහනුවර නාගරික සභාව. |
| 27. වික්‍රමසිංහ, ඩබ්. එම්. ඩී. බී. | | මාතලේ නාගරික සභාව. |

'සී' ප්‍රදේශය

| නම | | ලිපිනය |
|---|---|---|
| 28. ජෝශප්, ඒ. කිව්. ආර්. | ... | මන්නාරම සුළු නගර සභාව. |
| 29. කර්තිගේසු, කේ. | ... | මඩකලපුව පළාත් ආණ්ඩු සභාව. |
| 30. පංචලිංගම්, ආර්. | ... | යාපනය නාගරික සභාව. |
| 31. පීටර්, වී. | ... | කයිට්ස් සුළු නගර සභාව. |
| 32. රාජනාදන්, සී. | ... | යාපනය නාගරික සභාව. |
| 33. සින්නදුරේ, ටී. | ... | යාපනය නාගරික සභාව. |
| 34. සිතිර වේලායුදම්, එම්. | ... | මුලතිව් සුළු නගර සභාව. |

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 පෙබරවාරි මස 28 දින,
තැ. පෙ. 530,
කොළඹ.

2–176—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී—බී 40/48

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ යාපනයේ දිස්ත්‍රික්කයේ චාවකච්චේරි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජනවාරි මස 29 දින,
කොළඹ දීය.

අතුරු ව්‍යවස්ථා

### වාහන හා සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥපනතේ 39 වෙනි වගන්තිය යටතේ අයකරනු ලබන වාහන හා සතුන් පිළිබඳ බද්දේ කාර්යයන් සඳහා ඒ බද්දට යටත් වූ යම් වාහනයක් හෝ සතකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ සෑම තැනැත්තකු විසින් ම මීට යා කොට ඇති "අ" උපලේඛනයෙහි දක්වෙන ආකෘතියට සාරානුකූලවූ විස්තර උපලේඛනයක් සභාපතිට යැවිය යුතු ය. මේ ආකෘති පත්‍රය ගම් සභා කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

(11) ආඥපනතේ 39 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින තැනැත්තා 1965 වර්ෂය වෙනුවෙන් (1) වෙනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1965 නොවැම්බර් 30 වැනි දිනට හෝ ඊට පෙර සභාපති වෙත යැවිය යුතු ය. එකී තැනැත්තා ඒ වාහනය හෝ සතා අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී තැනැත්තාගෙන් එවැනි උපලේඛනයක් අවශ්‍ය නොවිය යුතු ය.

2. ආඥපනතේ 39 (2) වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම තැනැත්තකුම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උපලේඛනයේ සඳහන් වාහන හා සතුන් සඳහා වූ බද්ද 1965 අවුරුද්ද වෙනුවෙන් මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයෙහි පළ වූ දින සිට දින 30 ක් ඇතුළත ගෙවීමට යටත් විය යුතු ය. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් 30 කට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයෙහි තිබෙන්නාවූ එකී වාහන හෝ සතුන් සඳහා වූ බද්ද එකී වර්ෂයේ මාර්තු 31 වැනිද හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත් විය යුතු ය.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවකු විසින් ඒ උපලේඛනයෙහි සඳහන් නොකරන ලද්දාවූ ද ආඥපනත යටතේ බද්දට යටත්වූ ද යම් වාහනයක් හෝ සතකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් නැතහොත් ඉහතින් සඳහන් අතුරු ව්‍යවස්ථා යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවකු විසින් එකී බද්දට යටත් යම් වාහනයක් හෝ සතකු පළමු වරට අත්පත් කරගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු වාහනයක් හෝ සතකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට මාසයක් ඇතුළත දී ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව, තබා ගෙන සිටින බව හෝ පාවිච්චියට ගෙන තිබෙන බව සභාපතිට දැනුම් දිය යුතු ය. තවද, වැඩිදුරටත් මීට යා කොට ඇති "අ" උපලේඛනයෙහි දක්වෙන ආකෘතියට සාරානුකූල වූ ලිඛිත විස්තර ප්‍රකාශයක් වහාම සැපයිය යුතු ය.

4. ආඥපනතේ 39 (2) වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ප්‍රකාශය සැපයූවා වූ සෑම තැනැත්තකුම එකී ප්‍රකාශය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබූ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයෙහි තිබෙන්නාවූ වාහන හෝ සතුන් සඳහා වූ බද්ද ඒ සඳහා සභාපති විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළත දී ගෙවීමට බැඳී සිටිය යුතු ය.

5. (1) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ප්‍රකාශය සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ප්‍රකාශයෙහි සඳහන් කළාවූ යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥපනතේ 39(3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම තැනැත්තකු විසින් එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින හේතූන් දක්වෙන ලියවිල්කින් තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින බව වහාම සභාපතිට දැන්විය යුතු ය.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ප්‍රකාශය සැපයුවාට පසු වාහනයක් හෝ සතකු තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම තැනැත්තකු විසින් ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ වාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හළ බව වහාම සභාපති වෙත දැනුම් දිය යුතු ය.

6. යම් තැනැත්තකු විසින් යම් වාහනයක් සඳහා බද්ද ගෙවූ විට සභාපති විසින් ඒ බද්ද ගෙවූ වාහනය වෙනුවෙන් ඒ තැනැත්තාට මීට යාකොට ඇති "ආ" උපලේඛනයෙහි ඒ ඒ වාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරු ද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම් ද, වාහන රෙජිස්ටරයේ අනුරූප අංකය ද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුය. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය සභාපතිට ආපසු භාර දිය යුතු ය. තවද, ඔහු විසින් සත 50ක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබිය යුතු ය. එබඳු යම් තහඩුවක් නැතිවී තිබේ යයි හෝ සොරා ගෙන තිබේ යයි දිවුරුම් පෙත්සමකින් හෝ වෙනයම් අන්දමකින් තමා සෑහිමට පත් වුවහොත් එකී තහඩුව අයිතිකාරයා විසින් ඉල්ලුම් කරනු ලැබීමෙනුත් ඔහු විසින් සත හැටක් ගෙවනු ලැබීමෙනුත් පසු සභාපති විසින් ඔහුට අළුත් තහඩුවක් නිකුත් කළ හැකි ය.

7. සෑම වාහන අයිතිකරුවකු විසින් හෝ භාරකරුවකු විසින් 6 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ වාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ වාහනයේ ප්‍රකට ස්ථානයක සවි කළ යුතු ය.

8. සභාපති විසින් හෝ සභාපතිගේ ලියවිල්ලකින් බලය ලත් යම් නිලධාරියකු විසින් යම් මාවතක හෝ පාරක ගමන් කරන යම් වාහනයක 7 වෙනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවි කොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස ඒ වාහනය නවත්වා නතර කිරීම නීත්‍යානුකූල විය යුතු ය. තවද, සභාපති විසින් හෝ එකී නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටින කල්හි එකී වාහනයෙහි භාරකාරයා විසින් හෝ ඒ වාහනය පදවන්නා විසින් ඒ වාහනය නවත්වා සභාපතිට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතු ය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් කරනු ලැබේ.

"සභාව" යනුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ චාවාකච්චේරි ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස්වේ.

"ආඥපනත" යනුවෙන් (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනත අදහස් වේ.

## "අ" උපලේඛනය

**ආකෘතිය**

අංකය :

ඡන්ද කොට්ඨාශය :

### චාවකච්චේරි ගම් ප්‍රදේශයේ ගම්සභාව

වාහන හා සතුන් පිළිබඳව බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා ප්‍රකාර සැපයිය යුතු වූ වාහන හා/* හෝ සතුන් පිළිබඳ ප්‍රකාශයයි.

අයිතිකාරයාගේ හෝ ස්වාමිත්වය ඇති තැනැත්තාගේ නම :

ලිපිනය :

ගම :

| වාහන හා/* හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචන වලින් | වෙනත් විස්තර (බයිසිකලයක් නම් නිෂ්පාදක අංකය සඳහන් කළ යුතුය) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන .... | — | — |
| ගොන් දෙන්නා බඳින ඕනෑම අන්දමක කරත්ත හෝ තිරික්කල ... | — | — |
| තනි ගොනා බඳින ඕනෑම අන්දමක කරත්ත හෝ තිරික්කල ... | — | — |
| කුලී යෑම පිණිස වූ තනි ගොනා බඳින ඕනෑම අන්දමක කරත්ත හෝ තිරික්කල ... | — | — |
| ජින් රික්ෂෝ රථ ... ... | — | — |
| අත් කරත්ත ... ... | — | — |
| බයිසිකල් ... ... | — | — |
| අලි ... ... | — | — |
| අශ්වයෝ ... ... | — | — |
| අශ්වතරයෝ ... ... | — | — |

මෙහි ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

---

අයිතිකාරයාගේ හෝ සවාමිත්වය ඇති තැනැත්තාගේ අත්සන

දිනය :

*නුවමනා වචන කපා හරින්න

## "ආ" උපලේඛනය

කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර ඕනෑම අන්දමක වාහනයක් සඳහා .. சா. கி. ச. இ. வா.

ගොන් දෙන්නා බැඳින ඕනෑම අන්දමක කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා .. .. சா. கி. ச. இ.

තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා சா. கி. ச ஓ.

කුලී යෑම පිණිස වූ තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික් කලයක් සඳහා .. .. சா. கி. ச. ச. வா.

සෑම බයිසිකලයක් සඳහා .. .. சா. கி. ச. ஆ.

3–4—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

# අය වැය ලේඛනය

## වේයන්ගොඩ සුළු නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවන අය-වැය ලේඛනය

#### සාමාන්‍ය අංශය

| | | | රු. ශ. |
|---|---|---|---|
| ඒ. 1 (ඇ/ජ) | ... | ... | 400 00 |
| ඒ. 1. එච් | ... | ... | 70 00 |
| ඒ. 2. ඊ | ... | ... | 300 00 |
| ඕ. 5. ඕ | ... | ... | 15000 00 |
| | | | 15,770 00 |

#### විදුලි අංශය

| | | | |
|---|---|---|---|
| ඊ. ඇල්. 2 ඒ | ... | ... | 12000 00 |

1966 ක්වූ ජනවාරි මස 31 වෙනි දින පැවැත්වූ සභා රැස්වීමේදී අංක 22 දරණ යෝජනා සම්මත්වයෙන් ඉහත සඳහන් අතිරේක අය වැය ලේඛනය සභාව විසින් සම්මත කරගන්නා ලදී.

ජී. ඒ. ඩී. ඇල්. තිලකරත්න,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

වේයන්ගොඩ.
11. 2. 66.

3–170—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## ලුණුගල සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

ලුණුගල සුළු නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිඛ ස්ථානයක හෝ පාරක හමුවන, දඬාවතේ යන නැතහොත් බැඳ නො තබන ලද්දාවූ හෝ දක්කගෙන නොයනු ලබන්නාවූද, කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියෙකු), මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය මෙදින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

ඩබ්ලිව්. ඒ. පියදාස,
වැඩ බලන සභාපති, සුළු නගර සභාව, ලුණුගල.

1966.2.22 දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේදී.

3–171—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන—පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත

පළාත් පාලන ආයතන—පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වෙනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ වගපණ්ණහ උඩසිය පත්තුව කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරණු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මාතලේ දිස්ත්‍රික්කයේ වගපණ්ණහ උඩසිය පත්තුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන—පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 261 වැනි අධිකාරය 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

එච්. ඇම්. කේ. බණ්ඩා,
ගම්සභාපතිතැන.

වගපණ්ණහ උඩසියපත්තුව ගම්සභා කාර්යාලය,
නාඋල,
1966.2.22.

3–157—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

## ඔයබඩපේරුව ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වෙනි අධිකාරිය)

මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණතේ (272 වෙනි අධිකාරිය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැන වූද, ඔයබඩපේරුව ගම්සභාවේ සභාපති තැන වූද, ඩී. ඊ. විජයසුන්දර වන මම 1966 වර්ෂයේදී පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන දින වලදී කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබඩපේරුව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

පෙබරවාරි 19, 27.
මාර්තු 6, 13, 20, 28.
අප්‍රේල් 4, 12, 19, 27.
මැයි 4, 5, 11, 18, 26.
ජූනි 2, 3, 10, 17, 25.
ජූලි 2, 9, 16, 24, 31.
අගෝස්තු 8, 15, 23, 30.
සැප්තැම්බර් 6, 13, 21, 28.
ඔක්තෝබර් 4, 6, 13, 21, 28.
නොවැම්බර් 4, 11, 19, 26.
දෙසැම්බර් 5, 11, 19, 26.

ඩී. ඊ. විජයසුන්දර,
ඔයබඩපේරුව ගම්සභාවේ සභාපති.

1966.2.16,
ඔයබඩපේරුව ගම්සභාව,
තිහාරිය, කළගෙඩිහේන.

3–173—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ යාපනේ දිස්ත්‍රික්කයේ මුහමලෙයි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන ඇති පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මුහමලෙයි ගම් සභාව විසින් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට, පළාත් පාලන ඇමති විසින් සම්පාදිතව උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාවකින් අනුමත කරන ලද්දාවූ ද ඒ පිළිබඳ නිවේදනය 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය පිළිගැනීමට මෙයින් සම්මත කරගනු ලැබේ.

එස්. සින්නතුරේ,
සභාපති.

1965 වැනි දින,
පල්ලෙයි හී මුහමලෙයි,
ගම් සභා කාර්‍යාලයේ දී ය.

3-3—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## 261 වැනි අධිකාරිය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරියේ) 3 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල පළාත ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

(අ) පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබූ, 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබුවාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩ, සහ

(ආ) එකී ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබූ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූ එකී අතුරු ව්‍යවස්ථා මාලාවේම අංක 38 දරන කාණ්ඩයද,

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට කිතුල්ගල පළාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරියේ) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. පී. ලොකුමහත්මයා,
කිතුල්ගල පළාත ගම්සභාවේ සභාපති.

1966 ජනවාරි මස 18 දින,
කිතුල්ගල පළාත ගම්සභා කාර්යාලය,
බඳුල්ලවල, හක්බෙල්ලාවක.

3-6—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## හපුතලේ පළාත් ආණ්ඩු සභාව

### ගෝ ඝාතක ආඥපණත (272 වෙනි අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ (272 වෙනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල පරිදි නියමිත බලධරයාවූද, හපුතලේ පළාත් ආණ්ඩු සභාවේ සභාපති තැන වූද, මරක්කල හෙන්නදිගේ සමයදාස වන මම මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් දිනවල හපුතලේ පළාත් ආණ්ඩු සභා සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1966 ජනවාරි මස 6 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 පෙබරවාරි මස 4 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 මාර්තු මස 6 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 අප්‍රේල් මස 4 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 මැයි මස 4 | ... | වෙසක් පෝය දිනය |
| 1966 මැයි මස 5 | ... | වෙසක් පෝය දිනය |
| 1966 ජූනි මස 2 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 ජූලි මස 2 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 ජූලි මස 31 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 අගෝස්තු මස 30 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 සැප්තැම්බර් මස 28 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 ඔක්තෝබර් මස 4 | ... | ලෝක සත්ව දිනය |
| 1966 ඔක්තෝබර් මස 28 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 නොවැම්බර් මස 26 | ... | පසලොස්වක පෝය දිනය |
| 1966 දෙසැම්බර් මස 26 | ... | පසලොස්වක පෝය දිනය |

ඇම්. එච්. සමයදාස,
සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
හපුතලේ, 1966 පෙබරවාරි 17.

3-165—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## මාකඳුර ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වෙනි අධිකාරිය) 17 (i) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූද, මාකඳුර ගම්සභාවේ සභාපති තැනවූද, කේ. එම්. අදිකාරි වන මම, 1966 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛණයේ සඳහන් වන දිනවලදී, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාකඳුර ගම්සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

පෙබරවාරි 4, 12, 19, 27.
මාර්තු 6, 13, 20, 28.
අප්‍රේල් 4, 12, 19, 27.
මැයි 3, 4, 5, 11, 18, 26.
ජූනි 2, 3, 10, 17, 25.
ජූලි 2, 9, 16, 24, 31.
අගෝස්තු 8, 15, 23, 20.
සැප්තැම්බර් 6, 13, 21, 28.
ඔක්තෝබර් 6, 13, 21, 28.
නොවැම්බර් 4, 11, 19, 26.
දෙසැම්බර් 4, 11, 19, 26.

කේ. එම්. අදිකාරි,
මාකඳුර ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
මාකඳුර-ගෝනවිල,
1966.2.1.

3-163—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## හන්වැල්ල උඩුගහ පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය ඒ ඒ අයගේ නම් ඉදිරියෙන් ඇති ස්ථානවල 1966 පෙබරවාරි මස 1 වැනි දින සිට 1966 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මස් පිණිස සතුන් මැරීම හා විකිණීම යන කරුණු සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත්‍ර මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥා පණතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම සඳහා හන්වැල්ල උඩුගහ පත්තු ගම් සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය සහ වෙළඳාම |
| --- | --- |
| 1. සේනාසිංහ වික්ටර් සිල්වා ... | පුවක්පිටිය ප්‍රසිද්ධ වෙළඳපලේ හරක් මස්, එළුමස් කඩය. |
| 2. මද්දුමගේ ප්‍රැන්සිස් පෙරේරා | කොස්ගම ප්‍රසිද්ධ වෙළඳපොලේ හරක් මස්, එළුමස් කඩය. |
| —එම— ... | වැලිකන්නේ වැලිඕවිටිකන්ද නමැති ඉඩමේ පෞද්ගලික මස් පිණිස සතුන් මැරීමේ ස්ථානයක් පැවැත්වීමට. |

මෙයට,

කේ. පී. මර්තීනු අප්පුහාමි,
සභාපති තැන.
හන්වැල්ල උඩුගහ පත්තු ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
බොරළුගොඩ,
කොස්ගම.
1966. 2. 15.

3–168—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

## වත්තේගම පළාත් ආණ්ඩු සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 අධිකාරයේ 17(1) දරන වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත බලධාරී තැනවූද වත්තේගම පළාත් ආණ්ඩු සභාවේ සභාපති තැනවූද, ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ධර්මසිරි වන මම 1966 වර්ෂයේදී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දිනවල වත්තේගම පළාත් ආණ්ඩු සභාව සීමාව තුල මස් පිණිස සතුන් මැරීම හෝ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ධර්මසිරි,
සභාපති,
වත්තේගම පළාත් ආණ්ඩු සභාව.

1966 පෙබරවාරි 21 වැනි දින,
වත්තේගමදීය.

### උපලේඛනය

ජනවාරි 6 පසළොස්වක පෝය.
පෙබරවාරි 4 පසළොස්වක පෝය.
මාර්තු 6 පසළොස්වක පෝය.
අප්‍රේල් 4 පසළොස්වක පෝය.
මැයි 4 සහ 5 වෙසක් පසළොස්වක පෝය.
ජූනි 2 පොසොන් පසළොස්වක පෝය.
ජූලි 2 පසළොස්වක පෝය.
ජූලි 31 පසළොස්වක පෝය.
අගෝස්තු 30 පසළොස්වක පෝය.
සැප්තැම්බර් 28 පසළොස්වක පෝය.
ඔක්තෝබර් 28 පසළොස්වක පෝය.
නොවැම්බර් 26 පසළොස්වක පෝය.
දෙසැම්බර් 26 පසළොස්වක පෝය.

3–172—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

## ආනවිලුන්දන් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත (272 වන අධිකාරිය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරි) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූද, ආනවිලුන්දන් පත්තු ගම්සභාවේ සභාපති තැනවූද, තො. ඒ. ජාන්ස වන මම, 1966 වර්ෂයේදී පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් වන දිනවලදී හලාවත දිස්ත්‍රික්කයේ ආනවිලුන්දන් පත්තු ගම්සභා ප්‍රදේශ සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

1966 ජනවාරි මස 6, 20
1966 පෙබරවාරි මස 4, 19
1966 මාර්තු මස 6, 20
1966 අප්‍රියෙල් මස 4, 19
1966 මැයි මස 4, 18
1966 ජූනි මස 2, 17
1966 ජූලි මස 2, 16, 31
1966 අගෝස්තු මස 15, 30
1966 සැප්තැම්බර් මස 13, 28
1966 ඔක්තෝබර් මස 13, 28
1966 නොවැම්බර් මස 11, 26
1966 දෙසැම්බර් මස 11, 26

තො. ඒ. ජාන්ස,
සභාපති.

ගම්සභා කාර්යාලය,
ආරච්චිකට්ටුව, රාජකදලුව,
1966 පෙබරවාරි මස 17 දින.

3–17—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

## පානම ගම්සභාව—අම්පාර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අයවළුන් විසින් එහි දක්වෙන ස්ථානවල මස් විකිණීම පිණිස 1966 වර්ෂයේ දෙසැම්බර් 31 වෙනි දින දක්වාවූ කාලයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව අම්පාර දිස්ත්‍රික්කයේ පානමපත්තු පානම ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. නාගමුත්තු මහාරාජා, 3 වැනි කොටස, වැටියවෙල, පොතුවිල | ඌරු මස්... | ප්‍රසිද්ධ වෙළඳපොළ, 3 කොටස, පොතුවිල |
| 2. ඩබ්ලියු. ජී. පැන්ටිස් අප්පු, කෝමාරිය | ඌරු මස්... | ප්‍රසිද්ධ වෙළඳපොළ, කෝමාරිය |
| 3. එච්. ඩබ්ලියු. ඇල්බට් සිල්වා, 3 වැනි කොටස, පොතුවිල | ඌරු මස්... | ප්‍රසිද්ධ වෙළඳපොළ, 3 කොටස, පොතුවිල |

ජේ. ඇස්. ඩී. ඇම්. රත්වේරාළ සා. වි.,
සභාපති,
පානම, ගම්සභාව,

ගම්සභා කාර්යාලය,
3 වැනි කොටස, පොතුවිල. (නැ. ප.)
1966.1.10

3—161—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියාවූද, පුස්සැල්ලාව සුළු නගර සභාවේ සභාපති තැන වූද, ඒ. ඞී. ඩබ්ලිව්. පෙරේරා වන මම, 1966 වර්ෂයේදී පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී මහනුවර දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාව සුළු නගර සභා ප්‍රදේශ සීමාව ඇතුළත .මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1966 ජනවාරි 1 | ... | ජාතික වීරයින් සැමරීමේ දිනය |
| 1966 ජනවාරි 6 | ... | දුරුතු පසළොස්වක පෝය |
| 1966 පෙබරවාරි 4 | ... | නිදහස් අනුස්මරණ දිනය හා පසළොස්වක පෝය |
| 1966 මාර්තු 6 | ... | පසළොස්වක පෝය |
| 1966 අප්‍රියෙල් 4 | ... | පසළොස්වක පෝය |
| 1966 මැයි 3 | ... | වෙසක් පසළොස්වක පෝය |
| 1966 මැයි 4 | ... | එම අතිරේක දිනය |
| 1966 ජූනි 2 | ... | පොසොන් පසළොස්වක පෝය |
| 1966 ජූනි 3 | ... | එම අතිරේක දිනය |
| 1966 ජූලි 2 | ... | පසළොස්වක පෝය |
| 1966 ජූලි 31 | ... | පසළොස්වක පෝය |
| 1966 අගෝස්තු 30 | ... | පසළොස්වක පෝය |
| 1966 සැප්තැම්බර් 28 | ... | පසළොස්වක පෝය |
| 1966 ඔක්තෝබර් 4 | ... | සමස්ථ ලෝක සත්ව දිනය |
| 1966 ඔක්තෝබර් 28 | ... | පසළොස්වක පෝය |
| 1966 නොවැම්බර් 26 | ... | පසළොස්වක පෝය |
| 1966 දෙසැම්බර් 26 | ... | පසළොස්වක පෝය |

ඒ. ඞී. ඩබ්ලිව්. පෙරේරා,
පුස්සැල්ලාව සුළු. නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
පුස්සැල්ලාව, 1966.2.21

3–164—66.3.4 දින අංක 14,685 දරන ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන්වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 15 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 165 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 330 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පලවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 | 50 | 40 | 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 17 | 50 | 23 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 25 | 0 | 33 | 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු එක කොටසක්... | 0 60 | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 15 | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 30 | 0 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 66. 3. 4 | සිකුරාද ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 66. 4. 1 | සිකුරාද ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි ... | 66. 5. 6 | සිකුරාද ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි ... | 66. 6. 3 | සිකුරාද ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි ... | 66. 7. 1 | සිකුරාද ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි